**ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 29 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,056.51 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,014.18 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 42.33 ක් හෙවත් සියයට 4.01 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 962.76 | 928.63 | 34.13 | 3.55 |
| මූලධන | 93.75 | 85.55 | 8.20 | 8.75 |
| **එකතුව** | **1,056.51** | **1,014.18** | **42.33** | **4.01** |

**2.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18.45 | 18.11 | 13.45 | 18.85 | 58.00 | 40.65 |

**2.3** **පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 3.36 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0036/000 | 1.37 |
| 6000/0000/00/0002/0047/000 | 0.05 |
| 6000/0000/00/0018/0001/000 | 0.01 |
| 6000/0000/00/0019/0002/000 | 1.93 |
| **එකතුව** | **3.36** |

**2.4** **විගණන නිරීක්ෂණය**

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
| --- | --- | --- |
| දෙ පා (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| ර (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලින කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 16 ක් සඳහා එකතුව රු.මිලියන 36.41 ක අධිප්‍රතිපාදන සලසා තිබිම නිසා උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 11.05 ක් හෙවත් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.283,467 ක් වූ තැන්පතු 8 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.4.1 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් 1931 අංක 19 දරන විහාර දේවාලගම් පනතින් පාලනය වන විහාර හා දේවාලගම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකර තිබුණි. එමගින් පෙන්වා දී තිබුණු පහත සඳහන් අඩුපාඩු නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**(අ)** ක්‍රමවත් හා ප්‍රමාණවත් පරිදි පොත් පත් හා ලේඛන යාවත්කාලින නොකිරීම නිසා විහාර හා දේවාල සතු වත්කම් හා ආදායම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනිමට නොහැකි වී තිබුණි.

**(ආ)** අක්‍රමවත් මුදල් පරිහරණය නිවැරදි කළ යුතු බව ආදල පාර්ශවයන්ට දන්වා තිබුණද ඒවා ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ නිශ්චිත උපදෙස් ලබාදී නොතිබුණි.

**3.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**-----------------------------------------**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ එම වාර්තාව 2016 ජුනි 06 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.5 බේරුම් නොකළ බැරකම්**

**-----------------------------**

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් ප්‍රමාණය රු.මිලියන 101.05 ක් වී තිබුණි. එම ශේෂයෙන් රු.මිලියන 45.89 ක් වර්ෂ 1 කට වැඩියෙන් හා වර්ෂ 3 කට අඩු කාලයක සිටද, රු.මිලියන 55.16 ක් වර්ෂයකට වඩා අඩු කාලයක සිටද පැවැත එමින් තිබුණි.

**3.6 කාර්යසාධනය**

**----------------**

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකල ප්‍රධාන කාර්යයන්**

**-------------------------------------------------------**

දහම් පාසල් ගුරුවරු සඳහා නිල ඇඳුම් ලබා දීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවත්, පසුගිය වසර 4 තුළදී නිල ඇඳුම් ලබාදීමට ආදාළ කාල පරිච්ඡේදය තුළදී සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. තවද 2013 වර්ෂය සඳහාද නිළ ඇඳුම් ලබාදී නොතිබුණි.

**3.7 කළමනාකරණ දුර්වලතා**

**-----------------------------**

**මහානායක වාරිකාරාමය අළුත්වැඩියාව**

**-------------------------------------------**

මහානායක වාරිකාරාමය අළුත්වැඩියාව සඳහා රු.මිලියන 5.45 ක ප්‍රතිපාදන බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. මෙම ප්‍රතිපාදන සැලසීම හා ගොඩනැගිල්ල අළුත්වැඩියාව සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු. 250,000 ක් ඉක්මවන වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතුය. නමුත් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුමකට එළඹ නොතිබුණි.

**(ආ)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය භාවිතා කළ යුත්තේ විශේෂ අවස්ථානුගත කරුණු යටතේ පමණක් වුවද, අති විශේෂ අවස්ථාවක් නොවූ මෙම කොන්ත්‍රාත්තුව ජාතික තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව සිවිල් සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු සෑම ගෙවීමකින්ම නිශ්චිත මුදලක් රඳවා තබාගත යුතු වුවද, එසේ කිරීමෙන් තොරව මුළු කොන්ත්‍රාත් මුදලම එකවර පිරිනමා තිබුණි.

**(ඈ)** මූලික ප්‍රමාණ පත්‍රය අනුව මුළු ඉදිකිරීම කොටස් 13 කට බෙදා වෙන්කර තිබුණි. 2015 දෙසැම්බර් මාසය වන විට රු.මිලියන 5.45 ක මුදලක් ගෙවා තිබුණද, නිම කරන ලද හා නිමවෙමින් පවතින එකම කාර්යයක් හෝ සාර්ථකව ඉටුකර නොතිබුණි. ඉදිකිරීම සම්බන්ධව

සිදුකළ භෞතික පරීක්ෂාවේදී 2015 දෙසැම්බර් 31 දින වන විට නිම කරන ලද වැඩ ප්‍රමාණය පිළිබඳව ප්‍රකාශයක් ලබාදෙන ලෙස වැඩබිම් පරීක්ෂකගෙන් ඉල්ලා සිටියද එම නිලධාරියා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබුණි.

**(ඉ)** පෞරාණික වටිනාකමකින් යුත් ගොඩනැගිල්ලක් ශාසනාලයෙන් ශාසනය වෙත පූජාකර තිබුණද, එම පෞරාණික වටිනාකම ආරක්ෂා වන පරිද්දෙන් ගොඩනැගිල්ල නඩත්තු කිරීමට සහ අළුත්වැඩියාවට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 12 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 778 | 686 | 92 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 34 | 32 | 02 |
| | **එකතුව** | **825** | **730** | **95** |